# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,004 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 32 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 33 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 33 |


*සැ. යු.* - අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 පෙබරවාරි මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


31- B 081137— 353 (2017/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

**කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

සිරිනිවාසගම් ගෝගුලක්‍රිෂ්ණන්,
අංක 71/A, ඇඹිල්ලවත්ත පාර,
බොරලැස්ගමුව.

.....................................*පැමිණිලිකරු.*

නඩු අංකය : CH(Civil)120/2012/MR
වටිනාකම : රු. 4,734,000
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*එදිරිව*

1. ඉමියා පතිරන්නැහෙලාගේ නිල්කා අරුන්දතී පතිරණ,
අංක 489, මීගමුව පාර,
පෑලියගොඩ.

*විත්තිකරුගේ නව ලිපිනය :*

රුවන් පතිරණ,
වැව ගෙදර,
දිවුලපිටිය.

.......................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 10 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරුට එරෙහිව පැමිණිලිකරු වෙත රුපියල් හතලිස් හත් ලක්ෂ තිස් හතර දහස (රු. 4,734,000) ක මුදලක් සහ ඒ මත 2010.10.27 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වර්ෂයකට 16% බැගින් පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය ද, අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයේ විස්තර කර ඇති උකස් දේපළ ද, ඊට අයත් මාර්ග ප්‍රවේශ සහ විත්තිකරුවන්ට අයත් සියලුම අයිතිවාසිකම්, හිමිකම්, සම්බන්ධකම් හා කවර අන්දමේ ඉල්ලීම් ද සහිතව සියලුම කුලී ලාභ හෝ අනිකුත් ආදායම් හා එකී උකස් දේපළ නිසා ඇතිවන සියලුම ලැබීම් හා විත්තිකරුවන්ට හිමි සියලුම අයිතිවාසිකම් ද ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා යටත් හා ඇස්කිසි කළ හැකි බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබූ හෙයින් ද, අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු හා ඇස්කිසි ගාස්තු විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට තීන්දු ප්‍රකාශ කරනු ලැබූ හෙයින් ද,

ඉහත විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශය ඉටු කිරීම පැහැර හැර ඇති බැවින්, එකී නඩුවේ ක්‍රියාවේ යෙදීමේ ඇස්කිසි බලපත්‍රය මත අධිකරණයේ තහනමට ගත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල ඉඩම් දේපළ, ගොඩනැගිලි, ගහකොළ සහ පළතුරු සියල්ලම ඒවා පිහිටි ස්ථානයේ දී ම 2017 පෙබරවාරි මස 17 වැනි දින ප. ව. 2.30 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපළ මිල දී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25%ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30 ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපළට ප්‍රවේශ මාර්ගය.-* ගම්පහ මිනුවන්ගොඩ පාරේ උඩුගම්පොල හන්දියෙන් දකුණට ඇති උඩුගම්පොල-දිවුලපිටිය පාරේ යනවිට හමුවන නයිවල හන්දියේ සිට කි. මී. 6ක් පමණ දිවුලපිටිය දෙසට යන විට කි. මී. 13 සහ 14 කණු අතර වම්පසට හමුවන අබලන් යකඩ ගේට්ටුවකින් සමන්විත කෙටි තාප්ප සහිත ප්‍රවේශයෙන් තාර දමා ඇති අඩි 12ක් පළල පුද්ගලික පාරේ මද දුරක් ගොස් ප්‍රවේශ මාර්ගය වල් බිහිවී ඇති නිසා උතුරු පැත්තේ ළඳු කැලය සහිත විකල්ප මාර්ගයකින් අදළ දේපළට දුනට ප්‍රවේශ විය හැකි ය. එසේම දිවුලපිටිය සිට මීරිගම පාරේ යන විට හමුවන දකුණට ඇති උඩුගම්පොල පාරේ පැමිණෙන විට ද, (උඩුගම්පොල-දිවුලපිටිය පාරේ කි. මී. 13 සහ 14 කණු අතර) මෙම ඉඩමට ළඟා විය හැක.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අළුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, වැව ගෙදර පිහිටි විහාරගොඩැල්ල යන ඉඩමේ එස්. සෙනරත් බලයලත් මානක තැන විසින් වර්ෂ 2006.03.15 වැනි දින මැන සාදන ලද අංක 2763 දරන පිඹුරේ ප්‍රකාර බෙදු වෙන්කල අංක 01 දරන කොටසට මායිම්, උතුරට : අංක 544 දරන පිඹුරේ අංක 1 දරන බිම් කැබැල්ල ද, නැගෙනහිරට : අංක 544 දරන පිඹුරේ අංක 2 දරන කැබැල්ලේ ඉතිරි කොටස සහ ප්‍රවේශ මාර්ගය ද, දකුණට : ෆොන්සේකා හිමිකම් කියන ඉඩම ද සහ බස්නාහිරට : අංක 2600 දරන පිඹුරේ අංක 1 දරන කැබැල්ල ද මායිම් වූ අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ.

(මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 367/35 හි ලියාපදිංචි කර ඇත.)

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදන විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

2017 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

01-775

# නොතාරිස් ලැයිස්තුව

**දැන්වීමයි**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කළාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කරන සොනාලි ගෝතමී රාජපක්ෂ මහත්මිය සඳහා සිංහල භාෂාවෙන් ධුරයේ කටයුතු කිරීමට ලබා දී ඇති බලපත්‍රය 2016.06.17 වැනි දින සිට අවලංගු කිරීම ගරු ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

01-725

# විවිධ දැන්වීම්

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා
දැමීම සඳහා වූ
ඉල්ලීම් අංකය : HC(Civil)/70/2016/CO

සීමාසහිත එක්ස්පෝ බ්‍රෑන්ඩ් පැක්ස් (පුද්ගලික) සමාගම,
(EXPO BRAND PACKS (PVT) LTD,
(PV 85762) අංක 144,
පිකරින්ස් පාර,
කොළඹ 13.

*සහ*

වැලිසර කාර්මික සංකීර්ණය,
309/3, කොළඹ පාර, වැලිසර.

පිළිබඳ කාරණයේ දී ය.

ගණන් බේරා වසා
දැමීම සඳහා වූ
ඉල්ලීම් අංකය : HC(Civil)70/2016/CO

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

..................................*පෙත්සම්කරු.*

කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ පිහිටි කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් 2016 නොවැම්බර් මස 25 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණයට ඉහත සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2017 මාර්තු මස 22 වැනි දින මෙම අධිකරණයෙහි විමසීම සඳහා නියෝග කොට ඇති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද, ඕනෑම ණය හිමියෙකු විසින් හෝ එකී සමාගමේ ඕනෑම සහදයකයකු විසින් එකී පෙත්සම අනුමත කරන හෝ එයට විරුද්ධව නියෝගයක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එකී පෙත්සම විභාග කරන දිනයෙහි පුද්ගලිකව හෝ නීති උපදේශකයෙකු මඟින් හෝ ඔහුගේ ලියාපදිංචි කරන ලද නීතිඥවරුන් මඟින් එකී කාර්යයන් සඳහා පෙනී සිටීමට හැකි බව ද දන්වනු ලැබේ. නියමිත ගාස්තු ගෙවීමෙන් පසු මෙහි පහත අත්සන් තබා ඇති තැනැත්තවුන් විසින් එකී පෙත්සමේ පිටපතක් ඕනෑම ණයහිමියෙකුට හෝ එකී සමාගමේ සහදයකයකුට සැපයිය හැකි බව ද දන්වනු ලැබේ.

ජුලියස් සහ ක්‍රීසි
පෙත්සම්කරුගේ නීතිඥවරු,
අංක 41, ජනාධිපති මාවත,
කොළඹ 01.

*දැනගත යුතු යි.-* එකී පෙත්සම විභාග කරන දිනයේ දී පෙනී සිටීමට අදහස් කරන ඕනෑම තැනැත්තෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ අදහස දක්වෙන ලිඛිත දැන්වීමක් ඉහත කී නීතිඥවරුන් වන එකී ජුලියස් සහ ක්‍රීසි සමාගමට තැපෑලෙන් හෝ අතින් භාර දීමෙන් දන්වා එවිය යුතු වේ. එකී දැන්වීමෙහි පුද්ගලයෙකු නම්, ඔහුගේ නම සහ ලිපිනය හෝ ආයතනයක් නම් ආයතනයේ නාමය සහ ලිපිනය සහ එකී ආයතනය විසින් හෝ පුද්ගලයා විසින් හෝ ඔවුන්ගේ ලියාපදිංචි කරන ලද නීතිඥවරුන් විසින් හෝ අත්සන් තබා සිටිය යුතු ය. තව ද, 2017 මාර්තු මස 21 වැනි දින පස්වරු 6.00ට ප්‍රථමයෙන් ඉහත කී නීතිඥවරුන් වෙත එකී දැන්වීම ප්‍රමාණවත් කාලයක් තුළ දී ලැබීම සඳහා තැපැල් කිරීමෙන් හෝ අතින් භාර කිරීම ඉටු කළ යුතු වේ.

ජුලියස් සහ ක්‍රීසි,
පෙත්සම්කරුගේ නීතිඥවරු.

01-940

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.